# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1865/25 – 2014 ජූනි මස 03 වැනි අඟහරුවාදා - 2014.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

1989 අංක 06 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන සහ වතු සුහසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය මහීපාල හේරත් වන මම, සබරගමුව පළාතේ පළාත් සභාවේ 1989 අංක 06 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 2(2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති පී.පී. වික්‍රමසිංහ මහතා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී ප්‍රඥප්තියේ 2(1) වගන්ති යටතේ දක්වනු ලබන කරුණු සම්බන්ධව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු වන විශ්‍රාමික මහාධිකරණ විනිසුරු සමන් වික්‍රම වික්‍රමාරච්චි මහතා පත්කර ඇත.

02. තවද, සබරගමුව පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන සහ වතු සුහසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය මහීපාල හේරත් වන මා, සබරගමුව පළාතේ පළාත් සභාවේ 1989 අංක 06 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන පී.පී. වික්‍රමසිංහ මහතා එකී ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ කටයුතු කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබේ.

03. තවද, 1989 අංක 06 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 3 වගන්තිය, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ කටයුතු කළ පී.පී. වික්‍රමසිංහ මහතා එම ධුරයේ කටයුතු කිරීම වහාම අත්හිටුවා ඇති හෙයින් ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්යය ඉටු කිරීමටත් 1989 අංක 06 දරන පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තියේ 3(අ)(i) වගන්තිය, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධුරයේ කටයුතු කරන මොහොමඩ් සාලි මොහොමඩ් කාමෙල් මහතාට විධාන කරනු ලැබේ.

මහීපාල හේරත්,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර,
ප්‍රවාහන සහ වතු සුහසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා
ඉදිකිරීම් කටයුතු පිළිබඳ අමාත්‍ය,
සබරගමුව පළාත

2014 ජූනි මස 03 වැනි දින,
රත්නපුර, නවනගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.


1A - PG 001510— 30 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*